GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

06-01-2014

# මාධ්‍ය නිවේදනය

රජයේ රෝහල් වල සේවය කරන වෛද්‍යවරුන් බඳවා ගැනීම, උසස්වීම් ලබා දීම ඇතුළු විශ්‍රාම ගැනවීම තෙක් සියළු පටිපාටි යතාවත් කිරීම 1991 වසරේදී ආරම්භ කරන ලදි. 06/2006 චක්‍රලේඛ මගින් මේ සඳහා නියමයන් ඉදිරිපත් කරන ලද අතර ඊට අනුකූලව සෞඛ්‍ය අමාත්‍යාංශය සකස් කල යෝජිත වෛද්‍ය සේවා ව්‍යවස්ථාව සෞඛ්‍ය ලේකම්තුමා විසින් අනුමැතිය සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි.

එහිදී දැඩි විමර්ෂණයට භාජනය කරන ලද මෙම යෝජනා වලට අවුරුද්දකට පමණ පසු කොමිසමේ අනුමැතිය ලැබිණි. ඉන් අනතුරුව මුදල් අමාත්‍යංශයේ කළමනාකරණසේවා කොමිසමේ අනුමැතිය සහිතව රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය වෙත ඉදිරිපත් කෙරණි. රාජ්‍ය පර්පාලන අමාත්‍යංශයේ ලේකම්තුමාට ඉදිරිපත් කල කෙටුම් පත මාස කිහිපයක කාලයක් අධ්‍යනය කිරීමෙන් පසු අනුමැතිය ලැබුණි.

අනතුරුව සෞඛ්‍ය අමාත්‍යංශයේ යෝජනා නියමිත අනුමැතින් හතරම සමග සෞඛ්‍ය ලේකම්තුමා විසින් රාජ්‍ය සේවා කොමිසමට ඉදිරිපත් කරන ලදි.

එහිදී රාජ්‍ය සේවා කොමිසම වෙත ඉදිරිපත් කල යෝජිත වෛද්‍ය සේවා ව්‍යවස්ථාව අවුරුද්දක පමණ කාලයක් සලකා බලා අනුමත කිරීමකින් තොරව 06/2006 චක්‍රලේකයේ දැක්වෙන ආකෘතියට අනුව ඉදිරිපත් කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යංශයට දන්වා එවීය. තවත් මාස කිහිපයකට පසු ඉල්ලා සිටි වෙනස්කම් අනුව සකස් කල කෙටුම්පත ඉදිරිපත් කල විට තවත් අමතර වෙනස්කම් කිහිපයක් අවශ්‍ය බව සඳහන් කර සෞඛ්‍ය අමාත්‍යංශය වෙත හරවා එවීය. එම වෙනස්කම් නැවත සකස් කර තවත් මාස කිහිපයකට පසු නැවත රාජ්‍ය සේවා කොමිසම වෙත ඉදිරිපත් කෙරුණි. එවර යෝජිත සේවා ව්‍යවස්ථාවේ අඩංගු කරුණු 31ක් සඳහා තවදුරටත් පැහැදිලි කිරීම් අවශ්‍ය බව දන්වා එවීය. එම විමසීමට පිළිතුරු දුන් විට කැබිනට් තීරණයක් ඇති බව පවසමින් අනුමැතිය දීම ප්‍රමාද කළේය. එය මේ යෝජනා වලට අදාල නොවන බව පෙන්වා දුන් පසුවද අනුමත කිරීම ප්‍රමාද කරමින් සිටී. පිළිගත් ප්‍රධාන පෙලේ රාජ්‍ය ආයතනයක් එකවර සියළු අවශ්‍යතා දන්වන්නේ නැතිව වරින් වර විමසීම් කිරීම එහි අකාර්යක්ෂමතාවයට පැහැදිලි උදාහරණයකි.

රාජ්‍ය සේවා කොමිසම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනයට අනුව පිහිට වු ස්වාධින ආයතනයක් වන අතර රාජ්‍ය නිලධාරින් මගින් ක්‍රියාත්මක වේ. මෙහි ස්වාධිනභාවය කොතෙක්ද යත් කරුණු පැහැදිලි කර ගැනීමට හෝ හේතු දැක්වීමට රජයේ වෛද්‍යවරුන නියෝජනය කරන එකම වෘත්තිය සමිතිය වන රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට රාජ්‍ය සේවා කොමිසම වෙත කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත. මෙසේ ආකාර්යක්ෂමතාවය නිසා රාජ්‍ය ආයතනයක් අපවාදයට ලක් වීමට ඉඩ හැරීමෙන් රජය අපහසුතාවයට පත් කිරීම පිළිබඳව මෙම

රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණයක් රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය ආරම්භ කල යුතු බව අප යෝජනා කරමු.

තවද අත්‍යවශ්‍ය අනුමැතින් හතරම ලැබී තිබියදී රාජ්‍ය සේවා කොමිසම යෝජිත සේවා ව්‍යවස්ථාව අනුමත නොකිරීම පිළිබඳව සෞඛ්‍ය ලේකම්තුමා සමග සාකච්ජා කල ජනාධිපති ලේකම් ගරු ලලිත් වීරතුංග මහතා කනස්සල්ල පල කර ඇත.

සියළු අවශ්‍ය රාජ්‍ය ආයතන වල අනුමැතිය ලැබූ යෝජිත සේවා ව්‍යවස්ථාව අදට වසර දෙකකට ආසන්න කාලයක් තිස්සේ අනුමත නොකර ප්‍රමාද කිරීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය දැඩි විරෝධය දක්වන අතර පසුගිය 04 වන සෙනසුරාදා පැවැති මධ්‍යම කාරක සභාවේදී ඕනෑම ආකාරයක වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක නිරත වීමට එක්මතිකව තීරණය කරන ලදී.

මෙම රැස්වීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ශාඛා සංගම් වල නියෝජිතයන් සියල්ලම පහේ සහභාගි වු අතර ඕනෑම වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට ඇති කැපවීම දැඩිව අවධාරණය කෙරිණි.

අන්තර්ජාතික පිළිගැනීමට ලක් ව ඇති ශ්‍රී ලංකා වෛද්‍ය සේවාව ජාත්‍යන්තර සිදුවන වේගවත් වෙනස්කම් වලට මුහුණ දීම සඳහා උසස් වීම් පටිපාටියේ වෙනස්කම් සිදු කර ඇති අතර මෙම පිළිගැනීම අනාගතයේදීත් රඳවා ගැනීමෙන් ශ්‍රී ලංකාවේ වෛද්‍ය සේවාවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට යෝජිත සේවා ව්‍යවස්ථාව හැකි ඉක්මනින් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය බව අප දැඩිව අවධාරණය කරමු.

ස්තූතියි,

වෛද්‍ය සමන් අබේවර්ධන

ලේකම්

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර - | වෛද්‍ය නවීන් ද සොයිසා | - 0718582444 |
| | වෛද්‍ය නලින්ද හේරත් | - 0717876516 |
| | වෛද්‍ය නලින් ආරියරත්න | - 0714800942 |